**පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය : 290**

**ආයතනයේ නම : දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - පුත්තලම**

පාර්ලිමේන්තුවේ රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සහ ඒ සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119 (4) යටතේ ගරු ආයතන භාර අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

**பாராளுமன்ற வெளியீட்டு தொடர் இலக்கம் - 290**

**நிறுவனத்தின் பெயர் - மாவட்ட செயலகம் - புத்தளம்**

பாராளுமன்றத்தினால் அரசாங்க கணக்குக் குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 119(4) கீழ் நிறுவனங்களிற்குப் பொறுப்பான கௌரவ அமைச்சின் அவதானிப்புக்களும் மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்

**Parliamentary Series No: 290**

**Name of the Institution: District Secretariat - Puttalam**

**Submission of observations of Hon. Minister in charge of the Institutions and step taken with regard to the reports tabled by the Committee on Public Accounts in terms of Standing Order No.119 (4)**

**<u>අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, පළාත් සභා හා පළාත් පාලන ආයතනවලට අදාළ රාජ්‍ය ගිණුම් පිළිබඳව කමිටුව මගින් පාර්ලිමේන්තුව මගින් ඉදිරිපත්කරන වාර්තා සම්බන්ධයෙන් ආයතනභාර අමාත්‍යවරයාගේ නිරික්ෂණ සහ ගන්නා පියවර ඉදිරිපත් කිරිම</u>**

පාර්ලිමේන්තු ප්‍රකාශ මාලා අංක :- 290

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය :- පුත්තලම

| රා.ගි.කා. සභාව විසින් පෙන්වා දෙන ලද අඩුපාඩු හා මහපෙන්වීම් | ගණන් දීමේ නිලධාරී විසින් ගත් ක්‍රියාමාර්ග | වර්තමාන ප්‍රගතිය |
|---|---|---|
| පළමු කොටස -<br>1. විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත්කර තිබු සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුල පිළිතුරු සපයා නොතිබුණි.<br>2. අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුල පිළිතුරු නොසැපයු අවස්ථා වාර්තා විය. | විගණන විමසුම් සඳහා මසක් තුල පිළිතුරු සැපයීමට කටයුතු කරන ලෙස අදාළ කාර්ය මණ්ඩල දැනුවත් කර ඇත | විවිධ රාජ්‍ය ආයතනවල සහාය මත සිදුකරන ව්‍යාපෘති හා තාක්ෂණික කරුණු පරීක්ෂා කර පිලිතුරු සැපයිය යුතු අවස්ථාවක මසක් තුල පිළිතුරු සැපයීමට අපහසුවන අවස්ථා ඇත. |
| 3. වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිග ණය ශේෂ පැවතුණි. | හිග ණය ශේෂ අය කර ගැනිමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත. | නෛතික ක්‍රියාමාර්ග ගත යුතු ගොනු පිළිබඳව නීතිපතිතුමා වෙතින් උපදෙස් ඉල්ලුම් කර තිබේ. |
| දෙවැනි කොටස- | | |
| 01. 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධි විධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැළැස්මක් පිළියෙල කර නොතිබුණි. | 02/2018 ප්‍රකාරව 2022 වර්ෂය සඳහා මානව සම්පත් සැලැස්මක් සකස්කර නොතිබු නමුත් දි.ලේ.කා හා ප්‍රා.ලේ.කා 16 හි පුහුණු ඇතුලත්ව පුහුණු සැලැස්මක් සකස් කරතිබුනි. 2023 වර්ෂයේ සිට චක්‍රලේඛ ප්‍රකාරව මානව සම්පත් සැලැස්මක් පිලියෙලකර ඇත. | 2023 හා 2024 යන වර්ෂයන් සඳහා චක්‍රලේඛය ප්‍රකාරව මානව සම්පත් සැලැස්ම සකස් කර ඇත. |
| 02. සකස් කරන ලද මානව සම්පත් සැළැස්ම මගින් කාර්ය මණ්ඩලයෙන් සියයට 50කට වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් සහතික කර නොතිබුණි. | 2022 වර්ෂයේදි පුහුණු අවස්ථා සහතික කර තිබු නමුත් ආර්ථික අර්බුදය හමුවේ රාජකාරි කටයුතු සීමා කිරිම නිසාත් 2023 වර්ෂයේ අයවැය චක්‍රලේඛ 01/2023 හා 02/2023 අනුව වියදම් පාලනය කිරිම හේතුවෙන් සහ 2024 වර්ෂයේදි 1/2024 ජාතික අයවැය | රාජ්‍ය වියදම් පාලනය 2024 වෙනුවෙන් නිකුත් කල ජාතික අයවැය චක්‍රලේඛය 01/2024 05 ඡේදයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කරයි. |

| | | |
|---|---|---|
| | චක්‍රලේඛයේ 5 ඡේදය ප්‍රකාරව අවශ්‍ය පුහුණුවීම් සීමා කිරිම් නිසාත් 02/2018 චක්‍රලේඛය ප්‍රකාරව පුහුණුවීම් සිදු කිරිමට නොහැකි වී ඇත. | |
| 03. සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබුණි. | 2023 වර්ෂයේ සිට ගිවිසුම් ගතව ඇත. | 02/2018 (1) චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කරයි. |
| 04. මානව සම්පත් සංවර්ධන සැළසුම් සකස් කීරීමටද ධාරිතා හා නිපුණතා සංවර්ධන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමට ආයතනය තුළ ජ්‍යෙෂ්ඨ නිළධාරියෙකු නම් කර නොතිබුණි. | 2023 වර්ෂයේදි පත්කරන ලදි. | 2023 හා 2024 වර්ෂය සඳහා නිලධාරියකු පත් කර ඇත. |
| 05. හදුනාගත් කාර්ය දර්ශකයේ ළඟාවීම 24% ට වඩා අඩු ප්‍රමාණයෙන් විය. | කොවිඩ් වසංගත තත්වය තුල රටවසාතැබීම හේතුවෙන් 2021 දි හදුනාගත් කාර්ය දර්ශක ලගාකර ගැනිම අතපසු වුවද 2022 වර්ෂයේදි කාර්ය දර්ශක ලගාකර ගෙන ඇත. | 2022 වර්ෂයේදි කාර්ය දර්ශකය 115% පමණ වෙයි. |
| 06. සැළසුම්ගත පුහුණු අවස්ථා වලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවතුණි. | 2022 වර්ෂයේදි පුහුණු අවස්ථා සහතික කර තිබු නමුත් ආර්ථික අර්බුදය හමුවේ රාජකාරි කටයුතු සීමා කිරිම නිසාත් 2023 වර්ෂයේ අයවැය චක්‍රලේඛ 01/2023 හා 02/2023 අනුව වියදම් පාලනය කිරිම හේතුවෙන් සහ 2024 වර්ෂයේදි 1/2024 ජාතික අයවැය චක්‍රලේඛයේ 5 ඡේදය ප්‍රකාරව අවශ්‍ය පුහුණුවීම් සීමා කිරිම් නිසාත් 02/2018 චක්‍රලේඛය ප්‍රකාරව පුහුණුවීම් සිදු කිරිමට නොහැකිව ඇත. | රාජ්‍ය වියදම් පාලනය 2024 වෙනුවෙන් නිකුත් කල ජාතික අයවැය චක්‍රලේඛය 01/2024 05 ඡේදයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කරයි. . |
| 07. විගණකාධිපති වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. | | |
| ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව<br>3.5(අ) අළුත්වැඩියා කලයුතු නිල නිවස | ජාතික අයවැය චක්‍රලේඛ 01/2023 හා 02/2023 හා | වාර්ෂික ඇස්තමේන්තු තුලින් ලබාදෙන ප්‍රතිපාදන ප්‍රමුඛතා ගතකර අළුත්වැඩියා කටයුතු සිදු |

| | | |
|---|---|---|
| වාසස්ථානයට සුදුසු අයුරින් පිලිසකර කර ආදායම් උපයා ගැනිමට කටයුතු කල යුතුයි. | 01/2024 මගින් රාජ්‍ය වියදම් සීමා කර ඇති බැවින් අත්‍යාවශ්‍ය අළුත්වැඩියා කටයුතු සිදුකර ඇත | කිරිම. |
| 3.5 (ආ) ප්‍රමාදයකින් තොරව ඉඩම ලබාගෙන අදාළ කටයුතු සම්පූර්ණ කල යුතුය. | 2023.06.07 දින අදාළ පාර්ශව සමග විශේෂ සාකච්ඡාවක් පවත්වා ක්‍රියාත්මක විය යුතු ආකාරය ගැන තීරණ ගෙන ඇත. | නව නිල නිවාස 04 ඉදිකිරිමට අවශ්‍ය ඇස්තමේන්තු 2023.09.20 පුත්තලම නගර සභාවේ ලේකම් වෙත යොමු කර ඇත. |
| 3.7 (අ) 14 වන බිල්පත ගෙවීම් කොන්දේසි අනුව කලයුතුව තිබියදි ඒ අනුව කටයුතු නොකිරීමෙන් පොලි ගෙවීමට සිදුවී තිබූ බැවින්,ඒ පිළිබඳව පරික්ෂා කර වගකිව යුතු නිලධාරින් හදුනාගෙන ක්‍රියාමාර්ග ගත යුතුය. | ප්‍රසම්පාදන නිති රීති අනුව ගිවිසුම් ප්‍රකාරව නිලධාරින් ක්‍රියා කර ඇත. | නිලධාරින් ප්‍රසම්පාදන නීතිය අනුව බේරුම්කරණයේ උපදෙස් අනුව කටයුතු කර ඇත. |
| 3.8 අදාළ නිරිදේශ ලබාගත යුත්තේ ශක්‍යතා අධ්‍යන අවස්ථාවේදි වන අතර , ලබාදෙනු ලැබූ නිරිදේශ පිළිගත් ප්‍රමිතීන්ට අනුකූලද යන්න සලකා ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතුය. | සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිමේදි නිවැරදි ශක්‍යතා අධ්‍යනය කිරිමට වගකිව යුතු පාර්ශව දැනුවත් කර ඇත. | ශක්‍යතා අධ්‍යනයේදි අවශ්‍ය නිර්දේශ ලබා දි ඇත. |
| 3.9 (අ) වැඩිපුර ගෙවීම් වගකිව යුතු නිලධාරින්ගෙන් අයකල යුතුය. | 2021 වර්ෂය තුල පළාත් මිල කමිටු තීරණ මත කටයුතු කරන ලෙස නිලධාරින්ට ලබා දුන් උපදෙස් ප්‍රකාරව ක්‍රියාකර ඇත. වැඩිපුර ගෙවීමක් සිදුව නැත. | අර්ධ වාර්ෂිකව මිල කමිටු පවත්වා තීරණයන් ගනියි. |
| 3.9 (ආ)කාර්යක්ෂමව අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | මුදල් අමාත්‍යාංශ ලේකම්ගේ උපදෙස් මත රජයට ලැබිය යුතු හාල් වටිනාකම මුදලින් අය කරගනිමින් සිටියි. | තවදුරටත් මුදල් ගෙවීම් ප්‍රමාදවන මෝල් හිමියන්ට එරෙහිව අධිකරණ ක්‍රියාමාර්ග ගැනිමට සැලසුම් කර ඇත. |

දිස්ත්‍රික් ලේකම්
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
පුත්තලම

එච්.එම්.එස්.පී.හේරත්
දිස්ත්‍රික් ලේකම්/ දිසාපති
පුත්තලම පරිපාලන දිස්ත්‍රික්කය

ප්‍රධාන ගණකාධිකාරි
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
පුත්තලම

එච්.එම්.එම්.එච්. කළුනේගෙදර,
ප්‍රධාන ගණකාධිකාරි,
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,
පුත්තලම.

## ලේකම්තුමාගේ නිර්දේශය

දිස්ත්‍රික් ලේකම් විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග නිර්දේශ කරන අතර පෙන්වා දී ඇති අඩුපාඩු සම්බන්ධයෙන් පෞද්ගලික අවධානය යොමු කරමින් ඒවා නිවැරදි කරන ලෙස දිස්ත්‍රික් ලේකම්ට උපදෙස් ලබා දී ඇත.

ප්‍රදීප් යසරත්න

ලේකම්,

රාජ්‍ය පරිපාලන,ස්වදේශ කටයුතු,පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

ප්‍රදීප් යසරත්න
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා
හා පළාත් පාලන අමාත්‍යාංශය
(ස්වදේශ කටයුතු අංශය)
"නිල මැදුර" ඇල්විටිගල මාවත, කොළඹ 05.

## ඇමතිතුමාගේ නිර්දේශය හා ගෙන ඇති ක්‍රියාමාර්ග

රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් දිස්ත්‍රික් ලේකම් වෙත ලබා දී ඇති උපදෙස් කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් එම අඩුපාඩු නැවත ඇති නොවීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස මා විසින් අමාත්‍යාංශ ලේකම්තුමා වෙත උපදෙස් ලබා දී ඇති අතර එම ක්‍රියා මාර්ග 2024 වර්ෂය තුළ දී සාධනීය මට්ටම ප්‍රශස්ත මට්ටමට ළගා කර ගැනීමට අපේක්ෂා කරමි.

දිනේෂ් ගුණවර්ධන (පා.ම.)

අග්‍රාමාත්‍ය සහ

රාජ්‍ය පරිපාලන,ස්වදේශ කටයුතු,පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය.